# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2213/37 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2017 (III)

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

**1.** මේ නියෝග 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**2.** මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

**3.** මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම, පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

**4.** (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදුකරනු ලබන තැනැත්තාගේ සද්භාවය ; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූලව සිදු කර ඇති බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සිදුකිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

**5.** මේ නියෝවලට අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින්, අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

**6.** 2 වන නියෝගයේ සඳහන් සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම සහ එම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා මේ නියෝග යටතේ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන තැනැත්තන් විසින්, ඔවුන් නිරත වන විවිධ ප්‍රාග්ධන ගනුදෙනු මේ නියෝග යටතේ අවසර ලත් ගනුදෙනු වන බව ඔප්පු කිරීම සඳහා වන සියලු තොරතුරු සහ ලේඛනගත සාක්ෂි, එම ගනුදෙනුවේ දින සිට වසර හයක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

**7.** පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ප්‍රදානය කරන ලද යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලැබූ සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලුම විවිධ ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසු කාලීන නියෝග මගින් විශේෂ වශයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එම අනුමැතිය යටතේ එම ගනුදෙනු සඳහා නිශ්චිතවම දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය හැකි ය.

8. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යුරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි ; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මඟින්, කලින් කලට, (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

**9.** 2019 ඔක්තෝබර් මස 17 වන දිනැති අංක 2145/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග, ඒ යටතේ සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

**10.** මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ජංගම ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සමීපතම පවුලේ සාමාජිකයන්" යන්නෙන්, දෙමාපියන්, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසාය" යන්නෙන්, 2021 පෙබරවාරි මස 03 වන දිනැති අංක 2213/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(2 වන නියෝගය)

**උපලේඛනය**

**විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග**

**(අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට ශ්‍රී ලංකාව තුළදී ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම.**

පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධානවලට යටත්ව බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් පහත දැක්වෙන තැනැත්තන්ට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් නම් කරන ලද ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය -

(1) ශ්‍රී ලංකාවේ නේවාසික දේපළක් අත්පත් කරගැනීමේ, ඉදිකිරීමේ, සංවර්ධන කිරීමේ හෝ නවීකරණය කිරීමේ කාර්යය සඳහා වෙනත් රටක නිත්‍ය නේවාසිකයන් සහ ද්විත්ව පුරවැසියන් වන ශ්‍රී ලාංකිකයන්ට;

(2) යම් කාර්යයක් සඳහා ශ්‍රී ලංකාව තුළ දී භාවිත කිරීම පිණිස සහ ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ නේවාසික සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජංගම ගනුදෙනුවල කාර්යය සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට.

**(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපනයේ නියුතු ශ්‍රී ලාංකික සිසුන් විසින් ණය ලබාගැනීම්.**

1. පිටරට අධ්‍යාපනයේ යෙදී සිටින අතරතුර දී සිය අධ්‍යාපන ගාස්තු, ජීවන වියදම් සහ අධ්‍යාපනයට අදාළ වෙනත් වියදම් සපුරා ගැනීමේ කාර්යය සඳහා විදේශ රටවල පවතින බැංකුවලින්, මූල්‍ය ආයතනවලින්, විශ්වවිද්‍යාලවලින් හෝ අධ්‍යාපනික ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවෙන් අරමුදල් ප්‍රේෂණය කිරීම මගින් එම ණය මුදල පියවීම සඳහා අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින යම් ශ්‍රී ලාංකික පුරවැසියකුට අවසර ලබා දෙනු ලැබේ.

2. යම් බලයලත් වෙළෙන්දකු සහ පරිසීමිත වෙළෙන්දකු විසින්, ගනුදෙනුවේ සද්භාවය පරීක්ෂා කිරීමෙන් සහ අවශ්‍ය ලේඛනගත සාක්ෂි ලබාගැනීමෙන් පසු අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ශ්‍රී ලංකාවේ සිටින දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ණය මුදල් ගෙවීම සහ පියවීම වශයෙන් ණය ලබා දෙන ලද අදාළ ආයතනවලට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කරනු ලැබිය හැකි ය.

3. ඉහත කී ශ්‍රී ලංකා පුරවැසියකු විසින්, වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය හෝ වෙනත් රටක පුරවැසිභාවය සඳහා හිමිකම් ලබන තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් හෝ (ද්විත්ව පුරවැසිභාවය ද ඇතුළු ව) වෙනත් රටක පුරවැසිභාවය ලබා සිටින අවස්ථාවක දී, ණය මුදල් පියවීමට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ, එම තැනැත්තාගේ සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් විය යුතු ය.

**ඇ. මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවලට අදාළ ගෙවීම්.**

පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු සහ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්, පනත යටතේ අවසර දෙන ලද ජංගම ගනුදෙනුවලට සහ ප්‍රාග්ධන ගනුදෙනුවලට (එනම් පාදක ගනුදෙනු) අදාළ මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කරනු ලැබිය හැකි ය.

**ඈ. තාවකාලික නේවාසික වීසා බලපත්‍ර යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන තැනැත්තන් වෙත විදේශ විනිමය නිදහස් කිරීම.**

ශ්‍රී ලංකා ආගමන හා විගමන පාලක ජනරාල්වරයා හෝ වෙනත් අදාළ අධිකාරියක් විසින් නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රයේ කරන ලද සුදුසු පිටසනක් සමග එ.ජ.ඩො. 15,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක උපරිමයකට යටත්ව (අනාගත දිනයක දී යම් රටක නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගැනීම සඳහා පුද්ගලයකුට හිමිකම් ලබාදෙන තාවකාලික නේවාසික වීසා හැර) තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් යටතේ ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වෙත එම තැනැත්තන්ගේ විදේශයක ආරම්භක පදිංචි කටයුතුවල කාර්ය සඳහා වන මූලික දීමනාව වශයෙන් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් විදේශ විනිමය සාධාරණ ප්‍රමාණයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

**ඉ. භාණ්ඩ අපනයනකරුවන් විසින් අපනයන ඉපැයුම් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන ඒම.**

1. සෑම භාණ්ඩ අපනයනකරුවකු විසින්ම, අපනයනය කිරීම සිදු කරන ලද දින සිට දින 180ක් ඇතුළත හෝ මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් කාල සීමාවක් ඇතුළත භාණ්ඩ අපනයනය කිරීම සඳහා ලද ගෙවීම් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

2. සෑම භාණ්ඩ අපනයනකරුවකු විසින් ම, එක් එක් අපනයනය සම්බන්ධයෙන් අදාළ ලේඛනගත සාක්ෂි ගෙවීම ලබන අදාළ බලයලත් වෙළෙන්දා වෙත හෝ පරිසීමිත වෙළෙන්දා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. භාණ්ඩ අපනයනකරුවන් විසින් මේ ශීර්ෂය යටතේ වන නියමයන්ට අනුකූලවීම අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි පනතේ 11 වන වගන්තිය හෝ 26 වන වගන්තිය යටතේ අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

**ඊ. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙනුවෙන් මූල්‍ය ඇපකර නිකුත් කිරීම.**

1. පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, ජංගම ගනුදෙනු සහ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීම සඳහා සහ අලුත් කිරීම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

2. ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ණයට ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයට හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන්ට හැකියාව ලබාදීම පිණිස, ස්වෛරීත්ව ඇපකර නිකුත් කිරීමට ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙනු ලැබේ.

3. පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, එවැනි බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීමෙන් පැන නගින වලංගු හිමිකම් සම්බන්ධයෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදුකිරීම සඳහා ද බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

**උ. ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතන සමඟ ගිණුමක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවසර ලත් තැනැත්තන් -**

1. ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමඟ විදේශ ව්‍යවහාර ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට පහත දැක්වෙන තැනැත්තන් වෙත අවසර ලබා දෙනු ලැබේ -

(අ) ව්‍යාපාර සඳහා, අධ්‍යාපනය සඳහා හෝ වෛද්‍යමය කාර්ය සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට;

(ආ) ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමයට පරිවර්තනය කිරීමක් සිදු නොකර ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ විනිමය උපයාගන්නා ලද හෝ අන්‍යාකාරයෙන් අත්පත් කරගන්නා ලද, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව හෝ ඉන්පසු යම් අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකුව සිටි ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත වෘත්තීමය හෝ වෘත්තීය සේවා සපයනු ලබන සහ එකී සේවාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ විනිමයෙන් ගෙවීම් ලබා ගනු ලබන තනි පුද්ගලයකුට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට;

(ඈ) ආයෝජනය කිරීම සඳහා වන නියමයක් වශයෙන් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කිරීමට නියම කරනු ලබන අවස්ථාවක දී එසේ ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා පනතේ විධිවිධාන යටතේ සාමාන්‍ය හෝ විශේෂ අවසරයක් ප්‍රදානය කරන ලද තනි පුද්ගලයකුට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට;

(ඉ) වෙළඳ භාණ්ඩ අපනයනකරුවකුට;

(ඊ) වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය දරනු ලබන තැනැත්තකුට;

(උ) ද්විත්ව පුරවැසියකුට;

(ඌ) යම් රටක අධ්‍යාපනය ලැබීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට අදහස් කරන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසීන් වශයෙන් යම් රටක නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමඟ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සඳහා වීසා බලපත්‍ර ප්‍රදානය කරනු ලබන අධිකාරිය විසින් නියම කරනු ලබන අවස්ථාවක දී එම තැනැත්තාට;

(එ) විදේශ බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් මුදල් ණයට ගැනීම සඳහා හිමිකම් ලබන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමකට එකී ණය ගිවිසුමේ කොන්දේසියක් වශයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කිරීම සඳහා නියම කරනු ලබන්නේ නම්, එවැනි සමාගමකට.

2. (1) ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමග ගිණුමක් විවෘත කර පවත්වාගෙන යනු ලැබූ මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් තැනැත්තකු විසින්, මේ නියෝගවල අනුකූලවීමේ කාර්ය සඳහා එම ගිණුම් වසා දමනු ලැබිය හැකි ය.

(2) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු විසින් විවෘත කරන ලද ගිණුමකට, ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යනුකූලව උපයන ලද, ලබාගන්නා ලද හෝ අත්පත් කරගන්නා ලද හෝ එම තැනැත්තාගේ නාමයෙන් පනතේ විධිවිධාන යටතේ බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දකුගෙන් ශ්‍රී ලංකාවේ දී ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් බැර කරනු ලැබිය හැකි ය.

(3) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් විසින් විවෘත කරන ලද ගිණුම්වල අරමුදල්, ගිණුම් හිමියාගේ යම් විදේශ විනිමය ගනුදෙනුවක් සඳහා යොදා ගනු ලැබිය හැකි ය.

(4) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ (ආ), (ඇ), (ඊ), (උ) සහ (ඌ) අනුඡේදවල නිශ්චිතව සඳහන් වර්ග සඳහා හැර 1 වන ඡේදය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත මූල්‍ය ආයතනයක් සමග ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදෙන ලද යම් තැනැත්තකු විසින් එම ගිණුම විවෘත කරනු ලැබූ අරමුණු ඉටු වූ දින සිට මාසයක කාලය ඇතුළත ශ්‍රී ලංකාවෙන් පිටත එම තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුම්වල ඉතිරිව පවතින යම් ශේෂ අරමුදල් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

(5) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ (ඌ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති වර්ගය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සඳහා අවසර ලත් යම් තැනැත්තකුට ශිෂ්‍ය වීසා බලපත්‍රයක් ලබාදීම එම රට විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ ශිෂ්‍ය වීසා බලපත්‍රය ලබාගැනීමෙන් පසු අධ්‍යයන කටයුතු ආරම්භ නොකිරීමට එම තැනැත්තා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එම තීරණය ගනු ලැබූ දින සිට මාසයක කාලයක් ඇතුළත එකී තැනැත්තා විසින්, මේ නියෝගය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත එම තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුමේ බැරට පවතින සියලු මුදල් ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

**ඌ. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයන්හට ජීවිත රක්ෂණ ඔප්පු නිකුත් කිරීම.**

1. රක්ෂණය සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියකට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයන් (එනම්,රක්ෂණය වූ) සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටීම සඳහා ලියාපදිංචි වී ඇති සමාගමකට, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ විනිමයෙන් නම් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට අවසර ලබා දෙනු ලැබේ.

2. රක්ෂණය සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියකට යටත්ව, අදාළ ජීවිත රක්ෂණ ඔප්පුවලට අනුකූලව ප්‍රතිලාභ වශයෙන් (එනම්, ඔප්පුව දරන්නා රක්ෂණ ඔප්පුවේ සඳහන් කාලයට වඩා වැඩි කාලයක් ජීවත් වන අවස්ථාවක දී රක්ෂණය වූ තැනැත්තාට දෙනු ලබන කල්පිරීමේ ප්‍රතිලාභ, රක්ෂණය වූ තැනැත්තාගේ මරණයෙන් පසු මරණයේදී ප්‍රතිලාභියාට දෙනු ලබන ප්‍රතිලාභ හෝ ඔප්පුව ආපසු භාරදෙන තැනැත්තාට ගෙවිය යුතු වටිනාකම) මේ ශීර්ෂය යටතේ ඉහත 1 වන ඡේදයේ සඳහන් සමාගමක් විසින් කරනු ලබන ගෙවීම් වශයෙන් වන ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

02 - 380

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.